# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1922/61 - 2015 ජූලි මස 11 වැනි සෙනසුරාදා - 2015.07.11

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

**පාර්ලිමේන්තු මහ මැතිවරණය - 2015**

ඡන්ද පොළ පිහිටි ප්‍රදේශයේ පවතින තත්ත්වය හේතුකොට ගෙන එම ඡන්ද පොළට ගොස් ඡන්දය දීමට නොහැකි වෙතැයි සාධාරණ බියක් ඇති අයට වෙනත් ඡන්ද පොළකදී ඡන්දය දීමේ පහසුකම් ලබා ගැනීම සඳහා වූ ඉල්ලුම්පත් භාරගැනීම 2015.07.14 දින අවසන් වන බව දැනුම් දීම

2015 පාර්ලිමේන්තු මහ මැතිවරණයේ දී, තමන්ගේ ඡන්දපොළ පිහිටි ප්‍රදේශයේ පවතින තත්ත්වය හේතුකොට ගෙන ඡන්ද පොළට ගොස් ඡන්දය දීමට නොහැකි වෙතැයි සාධාරණ බියක් ඇති ඡන්ද හිමියන්ට වෙනත් ඡන්ද පොළකදී ඡන්ද දීමේ පහසුකම් ලබාගැනීම සඳහා ඉල්ලුම්පත්‍ර ඉදිරිපත් කළ හැකි වූ කාල සීමාව 2015.07.10 දිනෙන් අවසන් වීමට නියමිතව තිබූ නමුත් මහජනතාව, සිවිල් සංවිධාන හා දේශපාලන පක්ෂ විසින් කරන ලද නියෝජන සලකා බැලීමෙන් අනතුරුව ඉල්ලුම්පත් භාරගන්නා කාල සීමාව 2015.07.14 දින තෙක් දීර්ඝ කරන ලදී.

02. අයදුම්පත් භාරගන්නා අවසන් දිනය, කිසිම කරුණක් හේතුවෙන් නැවත දීර්ඝ කරනු නොලැබේ. එහෙයින් තවමත් ඒ සඳහා අයදුම්කර නොමැති, ඉහත සුදුසුකම සම්පූර්ණ කරන ලද හා 2014 ඡන්ද හිමි නාමලේඛනයේ ලියාපදිංචි, ඡන්ද හිමියන්ට, නිවැරදි ලෙස සම්පූර්ණ කරන ලද අයදුම්පත් තමා දනට පදිංචි වසමේ ග්‍රාම නිලධාරිගේ සහතිකය ද සමඟ 2015.07.14 දින හෝ ඊට පෙර රාජගිරියේ පිහිටි මැතිවරණ මහලේකම් කාර්යාලයට හෝ ළඟම පිහිටි දිස්ත්‍රික් මැතිවරණ කාර්යාල වෙත භාරදීමට කටයුතු කරන ලෙස කාරුණිකව දැනුම් දෙමි.

03. 2015.07.14 දිනට පසුව තැපැලෙන් හෝ අතින් ගෙනවිත් භාරදෙන අයදුම්පත් කිසිම කරුණක් හේතුවෙන් භාරනොගන්නා අතර ඒවා ප්‍රමාද වී ලැබුණු අයදුම්පත් ලෙස සලකා ප්‍රතික්ෂේප කෙරෙනු ඇත.

මහින්ද දේශප්‍රිය,
මැතිවරණ කොමසාරිස්.

2015 ජූලි මස 11 වැනි දින,
රාජගිරියේ පිහිටි මැතිවරණ මහලේකම් කාර්යාලයේ දී ය.
07-1340

*මෙම ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

1A - G 21894 — 58 (2015/07)

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.